ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලටඅදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	එස්ඒ-81 භාණ්ඩාගාර මුද්‍රිත ආකෘතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි මුළු ඉවත් කිරීම් රු.813,810,661 ක් හා ඉඩම් මුළු අත්පත් කර ගැනීම් රු.2,484,885,000 ක් වුවද, විගණනයට ඉදිරිපත් කළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ එම වටිනාකම සඳහන්ව නොතිබුණු අතර යන්ත්‍රෝපකරණ රු.773,171,897 ක් හා කෙරීගෙන යන වැඩ රු.542,487,542 ක් අඩුවෙන් දක්වා තිබුණි.	පරික්ෂා කර දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර වෙනස නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	විධිමත් පරිදි පරීක්ෂා කර දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර වෙනස නිවැරදි කළ යුතුය.
(ii)	ඒසීඒ-2(i) වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ රු.63,507,202 ක මූල්‍ය නොවන වත්කම් මිලදී ගෙන තිබුණද , එස්ඒ - 82 භාණ්ඩාගාර මුද්‍රිත ආකෘතියෙහි මිලදී ගැනීම් යටතේ එම මිලදී ගැනීම් සටහන්ව නොතිබුණි.	පරික්ෂා කර බලා නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	විධිමත් පරිදි පරීක්ෂා කර දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර වෙනස නිවැරදි කළ යුතුය.
(iii)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සූර්ය බලශක්ති පද්ධතියක් සවි කිරීමට දැරූ රු.11,598,279 ක පිරිවැය ප්‍රාග්ධනිත කර ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි දක්වා නොතිබුණි.	සූර්ය බලශක්ති පද්ධතියට දැරූ රු.11,598,279 ක මුදල 123-2-15-82-2506 වැය විෂය යටතේ දරන ලද අතර එය සංවර්ධන සහනාධාර යටතට ගැනෙන බැවින් ප්‍රාග්ධනිත නොකළ බව.	භාණ්ඩාගාරයෙන් විමසා මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (ii) - පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 109 යටතේ අයකරගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 හි සිදුවූ රු.276,950 ක වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 110 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.	අතපසුවීමකින් යාවත්කාලීන කිරීමට නොහැකි වී ඇති බව.	මුදල් රෙගුලාසි 110 අනුව හානි ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ උප අග්‍රිම ශේෂ රු.9,129,896 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ-3 ආකෘතිය මඟින් ඉදිරිපත් කර ඇති 2024 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි 2024 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව අග්‍රිම ශේෂයක් නොමැති බව දක්වා තිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව අග්‍රිම ශේෂය රු.9,129,896 ක් විය යුතු බව.	අග්‍රිම ගිණුම නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් ප්‍රකාශනය අනුව සහ එස්ඒ -92 භාණ්ඩාගාර මුද්‍රිත ආකෘතිය අනුව ශේෂයන්වල රු.1,009,850 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	එස්ඒ - 92 භාණ්ඩාගාර මුද්‍රිත ඇතුළත් වන්නේ 2025ජනවාරි 31 දිනට වන සිගාස් වැඩසටහනට ඇතුළත් කරන බැරකම් වන අතර 2025 ජනවාරි 31 න් පසුව වාර්තාවන බැරකම් භාණ්ඩාගාර මුද්‍රිත පිටපතේ ඇතුළත් නොවන බව.	බැරකම් නිවැරදිව හඳුනාගෙන කාල පමාවකින් තොරව සිගාස් වැඩසටහනට ඇතුලත් කිරීමට පියවර ගත යුතුය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණ				
	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම (රු.)	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1907 අංක 16 දරණ වන සංරක්ෂණ ආඥා පනතේ 64(2)(ඊ) වගන්තිය ප්‍රකාරව (451 වන අධිකාරිය) අනුව විෂයය භාර අමාත්‍යාවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග අංක 2216/34 හා 2021 පෙබරවාරි මස 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය	20,075,375	මාතලේ දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල පිහිටි කලුගල් කැනීම් වැඩබිම්වලින් 2023 හා 2024 වර්ෂ සඳහා අයකරගතයුතු කැලෑ නිෂ්පාදන ගාස්තු අයකර ගෙන නොතිබුණි.	අදාළ හිඟ ගාස්තු අය කර ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව.	කාලීනව ගාස්තු අයනොකළ නිලධාරීන් සම්බන්ධව පියවර ගැනීමටත් ගැසට්පත්‍රය අනුව කැලෑ නිෂ්පාදන ගාස්තු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	2016 අංක 08 දරන පුද්ගල ලියාපදිංචි කිරීමේ පනතේ 5 වැනි වගන්තියෙන් සංශෝධිත 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ 2 වන වගන්තිය	-	2024 දෙසැම්බර් 31 දිනට මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක ග්‍රාම නිලධාරි වසම් 195 ක වයස අවුරුදු 15 පසුවූ පුද්ගලයින් 1139 කට ජාතික හැඳුනුම්පත් නොතිබුණි.	ග්‍රාම නිලධාරි හරහා අදාළ දැනුවත් කිරීම් සිදුකරන බව.	කඩිනම් වැඩපිළිවෙලක් යොදා හැඳුනුම්පත් ලබා දීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 104(1)(අ) ඡේදය -	යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයක් 2024 ජූලි 10 දින අනතුරට පත්ව තිබුණද, මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩලය පත්කිරීම 2024 ඔක්තෝබර් 16 දින දක්වා ප්‍රමාද කර තිබුණි.	අදාළ කාල සීමාව මැතිවරණ කාල සීමාවක් නිසා ප්‍රමාද වී ඇති නමුත් ඉදිරියේදී එවැනි අතපසු වීම් සිදුවීම වළක්වා ගන්නා බව.	කාලීනව පරීක්ෂණ මණ්ඩල පත් නොකිරීම පිළිබඳ පියවර ගැනීමටත් පරීක්ෂණ කඩිනමින් සිදුකර ඉදිරි පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ii) මුදල් රෙගුලාසි 104(4) -	මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථයක් 2024 අප්‍රේල් 11 දින අනතුරට පත්වීම සම්බන්ධයෙන් 2025 ජනවාරි 31 වන විගණන දින වන විට අනතුර සිදුවී මාස 09කට අධික කාලයක් ගතව ඇතත් අලාභ හානිය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.	වාර්තාව ඉදිරිපත් කිරීමට උසාවි නියෝගයේ පිටපතක් අවශ්‍ය බවත් එය මේ දක්වා ලැබී නොමැති බවත් ලැබුණු පසු වාර්තාව කඩිනමින් ලබාදෙන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත් මුදල් රෙගුලාසී ප්‍රකාරව කටයුතු කිරීමත් කළ යුතුය.

3.4 අවිධිමත් ගනුදෙනු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මුදල් රෙගුලාසි 137 (5) ප්‍රකාරව සැපයීම් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී ඒවා පරීක්ෂාකොට නිවැරදි ලෙස භාරගත් පසු ගෙවීම් වවුචර් අනුමත කිරීමට කටයුතු කළයුතු වුවද විල්ගමුව ප්‍රාදේශීය ලේකම්	2025.03.24 වන දින අදාළ පුටු ලැබී ඇති බවත් 2025මාර්තු 26 වන දිනට ගෙවීම් චෙක්පත අදාළ ආයතනයට ලබාදී ඇති බව.	අවිධිමත් පරිදි කටයුතු කළ නිලධාරීන් සම්බන්ධව පියවර ගැනිමටත් නොපමාව භාණ්ඩ ගෙන්වා ගැනීමටත් කටයුතු කළ යුතුය.

කාර්යාල විසින් පෞද්ගලික ආයතනයකින් මිලදීගත් රැස්වීම් ශාලා පුටු සඳහා 2024 දෙසැම්බර් 27 දින රු.365,421 ක් ගෙවීම් කළද විගණන දිනයවූ 2025 මාර්තු 03 දින වන විටත් එම භාණ්ඩ අදාළ සැපයුම්කරුගෙන් විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙන්වා ගෙන නොතිබුණි.

3.5 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක ඉන්ධන දහනය පිළිබඳ අක්‍රමිකතාවයක් හේතුවෙන් 2022 දෙසැම්බර් මස 29 දින රියදුරුගෙන් අයකරගන්නා ලද රු. 28,290 ක මුදල වර්ෂ 02 කට අධික කාලයක් අදාළ පරීක්ෂණ කඩිනමින් ඉටුනොකිරීම හේතුවෙන් පොදු තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.	අදාල පරීක්ෂණ වාර්තාව ලැබී ඇති නිසා එම ශේෂය රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව.	අදාළ පරීක්ෂණ කඩිනමින් නිම කර පොදු තැන්පත් ගිණුම් ශේෂ නිරවුල් කර ගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 පෙබරවාරි 20 දිනැති අංක 2020/06 දරන ශ්‍රී ලංකා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ආර්ථික සවිබල ගැන්වීමේ ව්‍යාපෘති සඳහා ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන් මඟින් සහන ණය ලබාදීමේ නව සංශෝධන ක්‍රියාත්මක කිරීම පිළිබඳ චක්‍රලේඛය අනුව රත්තොට හා විල්ගමුව සමෘද්ධි ප්‍රජා මූල බැංකු 06 ක ණය ලාභීන් 27 දෙනෙකුගෙන් රු.384,389 ක හිඟ ණය මුදලක් මාස 01 සිට මාස 05 දක්වා කාලයක සිට අයනොවී පැවතුණි.	ණය ලාභීන් 08 දෙනෙකුගෙන් එක් අයකු ගෙවා අවසන් බව හා අනෙක් අය දැනුවත් කර ඇති බව.	විධිමත් අධීක්ෂණයක් සිදුකර කාලීනව ණය අයකර කිරීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමටත් ණය අය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීමත් කළ යුතුය.

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාන්තා හා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත විදේශගත වන කාන්තාවන් වෙනුවෙන් විකල්ප ආදායම් උත්පාදන මාර්ග, ව්‍යාපෘති වැඩසටහන යටතේ බතික් කර්මාන්තයට අදාළව ප්‍රතිලාභියෙකු සඳහා රු.25,000 ක් වියදමක් දරා උපකරණ ලබාදී තිබුණද මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභියා තෝරාගත් නිර්ණායක තහවුරු වී නොතිබුණි.	විදේශ ගත වීමට බලාපොරොත්තුවෙන් සිට ඇති බව.	ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී නිර්නායක හඳුන්වාදී ඒ අනුව විනිවිදභාවයකින් යුතුව තෝරා ගැනීමට කටයුතු කළ යුතුය.

4.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2007 වර්ෂයේ ජාතික සවිය සංවර්ධන වැඩසටහන යටතේ යෝජනා වූ හා 2007 සැප්තැම්බර් 17 දින අනුමත කර තිබූ බත්ගම්පල සහල් සැකසීමේ ව්‍යාපෘතිය විගණන දින වූ 2025 මාර්තු 03 දින වන විටත් වර්ෂ 18 කට අධික කාලයක් ව්‍යාපෘතියේ අරමුණ ඉටුකර ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි.	දීර්ඝ කාලීන බදු පදනමට ලබා ගැනීමට අවශ්‍ය ඉල්ලීම් ලිපිය ඉඩම් කොමසාරිස් කාර්යාලයට යොමු කරන ලෙස දන්වා ඇති බවත්, වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ලග්ගල විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරි කැඳවා ඇති බව.	විධිමත් පරීක්ෂාවක් සිදුකර ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, කඩිනම් වැඩපිළිවෙලක් යොදා ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමටත් කටයුතු කළ යුතුය.

4.4 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ඇ) වගන්තිය අනුව ලියාපදිංචි සැපයුම්කරුවන් ප්‍රමාණවත්ව සිටියදී ඔවුන්ගෙන් මිල කැඳවීම් ලබා නොගෙන ඒ සඳහා කරුණු දැක්වීමකින් තොරව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලෝක ආහාර වැඩසටහන යටතේ ගෙවතු වගා ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 පරිපූරක 40 හා 2006 පරිපූරක 40 හි 3.4 අනුව කටයුතු කර ඇති බව.	විධිමත් පරීක්ෂාවක් සිදුකර ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පරිභාහිරව කටයුතු කර ඇති පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතුය.

රු.9,149,175 ක් ද , මාතලේ බර්නාඩ් අළුවිහාරේ කායවර්ධන මධ්‍යස්ථානයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු.14,158,466 ක්ද වැය කර තිබූ අතර, මිලදී ගෙන තිබූ කායවර්ධන උපකරණ තාක්ෂණික පිරිවිතරවලටද අනුකූලවී නොතිබුණි.

4.5 වත්කම් කළමනාකරණය

.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 5 ක් වසර 02කට අධික කාලයක සිට නිෂ්කාර්යයව පැවතුණි.	අපහරණයට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව.	ඵලදායීතාවය පරීක්ෂාකර අළුත්වැඩියා කර භාවිතා කිරීම හෝ විධිමත් පරිදි අපහරණය කළ යුතුය.
(ආ)	අඹන්හග කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ලක් ඌන උපයෝජිතව පැවතුණ අතර ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අයත් බදු ලබා දී තිබුණු ගොඩනැගිල්ලකින් 2015 වර්ෂයේ සිට බදු කුලී අයකර නොතිබුණි.	ගොඩනැගිල්ලෙහි මැටි වරිච්චි බිත්තිවලට වේයන්ගෙන් නිතර නිතර හානි පැමිණෙන බව හා භාවිතා කිරීමට හැකි එහි කොටසක සතුන්ගෙන් හානි නොවන අයිතම ගබඩා කර ඇති බව	ඌන උපයෝජිත වත්කම පූර්ණ උපයෝජන වැඩපිළිවෙලක් යෙදීමටත්, බදු කුලී කඩිනමින් අයකර ගැනීමටත් පියවර ගත යුතුය.

4.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 881 (1) සහ 2019 මාර්තු 23 අප්‍රේල් 09 දිනැති අංක 07/2019 දරන අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ රාජ්‍ය නිලධාරීන්ගේ ඇප අය කිරීම පිළිබඳ චක්‍රලේඛයේ 05 වන ඡේදය අනුව රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.11,500 ක ඇප තැන්පත් මුදල් ලබා ගෙන නොතිබුණි.	නව ගිණුම් විවෘත කිරීමට හා ඇප තැන්පත් පාස් පොත් කාර්යාලය වෙත ගෙන්වා ගෙන ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ අනුව ඇප තැබිය යුතු රාජ්‍ය නිලධාරීන්ගේ ඇප තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය.

4.7 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 රජයට ඉඩම් අත්කර ගැනීමේ ආඥා පනතෙහි 361 වගන්තියෙහි 4 ඡේදය අනුව 38 (අ) අතුරු විධානය පලකර වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් මාර්ග සංවර්ධනය සඳහා අත්පත් කරගත් මාතලේ හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල පිහිටි ඉඩම් කැබලි 40 ක් වෙනුවෙන් රු.39,163,641 ක පොලී මුදලක් ගෙවා තිබුණි.	ඉඩම් අත්පත් කර ගැනීමේ පනත අනුව 38(අ) අතුරු විධානය යටතේ ආඥාව නිකුත් කළ දින සිට කළ යුතු කාර්යයන් ඉටු කිරීම සඳහා ගතවී ඇති කාලය සඳහා පොලි මුදල් ගෙවීම සිදුකල බව.	අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් නිම කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හා සැලසුමක් සකස් කර ක්‍රියත්මක කළ යුතුය.

4.8 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 අප්‍රේල් 04 දිනැති මුදල්, ආර්ථික ස්ථායිකරණ සහා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ DFD/2024-1 දරන චක්‍රලේඛයේ 2.3.2 ඡේදයේ සඳහන් පරිදි ගිවිසුම්ගත සහල් මිලදී ගැනීම සඳහා සහල් මෝල් හිමියන් සමඟ සෘජුවම සම්බන්ධ නොවී තෙවන පාර්ශවයන් හරහා සහල් මිලදී ගෙන , තෙවන පාර්ශවයන් වෙත සහල් සඳහා රු.281,901,227 ක් ද ප්‍රවාහන වියදම් ලෙස රු.6,623,772 ක් ද වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.288,524,999 ක් ගෙවා තිබුණු අතර භාණ්ඩ සැපයීමට පෙර ගිවිසුම්ගතවීමක්ද සිදුකර නොතිබුණි.	දිස්ත්‍රික්කය තුළින් ඉතා සුළු සහල් ප්‍රමාණයක් සපයා ගත හැකිව තිබූ බවත් , මෙම වැඩසටහන මුළු දිවයින පුරාම සිදුකළ යුතු බැවින් , සියළුම දිස්ත්‍රික්කවල සහල් මෙම අවස්ථාවේදී තම දිස්ත්‍රික්කවලට සපයා ගැනීමෙන් අනතුරුව වෙනත් දිස්ත්‍රික්කවලට සැපයීමට එකගවී තිබූ බවත් සහල් ලබාදුන් තෙවන පාර්ශවය සමඟ ඒ අවස්ථාවේ ලිඛිත ගිවිසුම්ගත වීමක් සිදු නොවූ අතර, පසුව ගිවිසුම්ගත වූ බව.	විධිමත් පරීක්ෂණයක් සිදුකර මූල්‍ය අවභාවිතයක් සිදු වී ඇත්නම් අදාල පාර්ශව වෙත විධිමත් පියවර ගැනීමටත් රජයට සිදුවී ඇති පාඩුව අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	සහල් කි.ග්‍රෑම් 503,260 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.94,581,030 ක් හා රු.2,435,981 ක් ප්‍රවාහන ගාස්තු ගෙවීම සඳහා බිල්පත්‍ර ඉදිරිපත්කර තිබූ සහල් මෝලක් අක්කරෙපත්තුවෙහි එම ලිපිනයෙහි නොමැති බව ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි මෙන්ම අක්කරෙපත්තු මෝල් හිමියන්ගේ සංගමයේ ලේකම්වරයාද සනාථ කර තිබීම	පැහැදිළි ඉන්වොයිස් ඉදිරිපත් කර ඇති බැවින් හා අදාල හාල් ප්‍රමාණයන් ලද බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් තහවුරු කර ඇති බැවින් ගෙවීම් කළ බව.	-එම-

	අනුව ගෙවීම් කිරීමේ විනිවිදභාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි වූ අතර තිස්සමහාරාම සහල් මෝලයකින් සහල් කිලෝ ග්‍රෑම් 117010 ක් සැපයුම් කළ බවට රු. 21,763,860 ක් හා ප්‍රවාහන වියදම් ලෙස රු.521,973 ක් ගෙවීම් කර තිබුණද අදාළ සහල් මෝල් හිමිකරුගේ ප්‍රකාශ අනුව ඔහු විසින් සපයා ඇත්තේ සහල් 30,000 Kg පමණක් හා ප්‍රවාහන වියදම රු.120,000 ඔහු අතින් දරා එම සහල් ප්‍රවාහනය කර දී ඇති බැවින් රු.521,973 ක සාවද්‍ය ප්‍රවාහන වියදමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සිදු කර තිබුණි.		
(ඇ)	මුදල් රෙගුලාසි 128(1) (අ) අනුව රජයේ කටයුතු ඉටුකිරීමේදී අපේක්ෂිත අරපිරිමැසීම, කාර්යක්ෂමතාවය, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳව නිසි සැලකිල්ලකින් යුත්කව තම ආයතනයේ කටයුතු කරගෙන යනු ලබන බවට විශේෂයෙන් වියදම් කරනු ලබන මුදල සඳහා උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරීම ගණන්දීමේ නිලධාරියකු ලෙස දිස්ත්‍රික් ලේකම්වරයාගේ වගකීම වුවද සහල් කි.ග්‍රෑම් එකක් සඳහා ආසන්න වශයෙන් රු. 10 ක් පමණ වූ එකතුව රු.15,076,800 ක අතිප්‍රාමාණික ලෙස ලාභයක් උපයා ගැනීමට බාහිර පාර්ශවයකට ඉඩ සලසා තිබුණි.	මෙම කාල වකවානුව තුළ රජය සහල් සඳහා ප්‍රකාශිත පාලන මිලද වඩා වැඩි අගක් ගත් හෙයින් චක්‍රලේඛය අනුව රජයේ නියම කළ මිලට සහල් ලබා ගැනීමද අසීරු කාර්යයක් වූ බවත්, ආසන්නතම ප්‍රදේශවල අවශය සහල් ප්‍රමාණයක් නොතිබුණු බැවින් අම්පාර , අක්කරෙපත්තුව ප්‍රදේශවලින් නියමිත ප්‍රමිතියට අනුව සහල් ලබා ගැනිමට සිදු වූ බව.	-එම-

4.8 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(අ)	2013 ජූලි 05 දිනැති අංක HAF-3-ADMIN -02-002 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයේ 07 වන වගන්තිය අනුව රජය සතු ඉඩම්වල අනවසරකරුවන් ඉවත් කිරීමට රජයේ ඉඩම්	රක්ෂිත කොටස නිශ්චිතව හඳුනා ගැනීමට අනවසරකරුවන් ඉවත් කිරීමට, ඉඩම් කච්චේරි කඩිනමින් පැවැත්වීමට හා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදුකරන බව.	ඉඩම් අනවසරකරුවන් පිළිබඳ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත් පනතේ විධිවිධාන ප්‍රකාරව කඩිනමින් කටයුතු

	(සන්තකය ආපසු ගැනීමේ) පනත යටතේ කටයුතු කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් කළ යුතු බවට දක්වා තිබුණද ගලේවෙල, විල්ගමුව, රත්තොට, අඹන්ගග කොරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වාර්තා වී තිබූ අතර රජයේ ඉඩම් වල අනවසර පදිංචිකරුවන් 13 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.		කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	විල්ගමුව, මාතලේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල විශ්‍රාම වැටුප් ලාභීන් 17 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවා තිබුණු රු.4,140,182 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් අයකර ගැනීමට පැවතුණි.	විවිධ හේතු මත වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් අයකර ගැනීමට කටයුතු කරන බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවීම් කිරීම සඳහා නිලධාරීන් වගකිව යුතු නම් ඊට අදාල පියවර ගැනීමටත් වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතුව සිට 2023 වර්ෂයේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම සිදුකර තිබූ සේවකයෙකු ගේ හිඟ ණය ශේෂය වන රු. 125,322 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර රජයේ අමාත්‍යාංශවලට/ දෙපාර්තමේන්තු වලට ස්ථානමාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය වන රු.708,873ක ශේෂය හා ලැබීමට ඇති ණය අත්තිකාරම් යටතේ වූ රු.39,593 ණය ශේෂය වර්ෂ 1-3 අතර කාලයක් ගතවී තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම නිලධාරියා සම්බන්ධයෙන් විනය පරීක්ෂණ කටයුත්තක් සිදු කෙරෙමින් පවතින බැවින් විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරනු නොලැබෙන බවත් විනය පරීක්ෂණ අවසන් වූ පසු ලබා දෙන තීරණ මත ඉදිරි ක්‍රියාමාර්ග සඳහා එළඹිය හැකි බව.	විශ්‍රාම ගිය නිලධාරීන්ගේ හිඟ පොලිය විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීමේදී අයකර ගැනීමටත් ඉතිරි ණය පොලී කඩිනමින් අයකිරීමටත් පියවර ගත යුතුය.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පිහිටි කළුගල් කැනීමේ කර්මාන්තයක් සඳහා අවස්ථා ගණනාවකදී මහජන විරෝධතා දක්වා තිබුණද ගල් පිපිරවීම්/කැණීම් කාර්යයන් සඳහා පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍රයක් නිකුත් කිරීම සඳහා වූ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ 2023 දෙසැම්බර් 18 දිනැති අංක 01/2024 චක්‍රලේඛයේ 1 "අ" ආකෘතිය මඟින් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ජීවත්වන නේවාසිකයින් ගල් බෝර දැමීම පිළිබඳ විරුද්ධත්වයක් නොමැති බවට සහතිකයක් කළුගල් කර්මාන්තකරුවන් දෙදෙනෙකුට ලබාදී තිබුණි.	අදාළ සියලු ආයතන, බලපත්‍රවරුන් සහ විරෝධතා දක්වන පාර්ශව සමඟ පැවති ඒකාබද්ධ රැස්වීම් තීරණය පරිදි සහ සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ලබාදුන් තීරණය පරිදි අදාළ ආකෘති මඟින් නිර්දේශ ලබා දී ඇති බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා සාවද්‍ය තොරතුරු මත ආකෘතිපත්‍ර පුරවා ඇත්නම් අදාළ පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතුය.
(ආ)	ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ 2020 මැයි 15 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයේ 4 (iv) ඡේදය ප්‍රකාරව දේපල හානි සඳහා මුදල් ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක 2024 වර්ෂයේ තත්සේරු කරන ලද ප්‍රතිලාභීන් 208 ක් සඳහා වූ රු.2,768,760 ක වන්දි මුදලක්, ලබාදීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාදයන් ඇති බව.	විධිමත් පරිදි කටයුතු කර අමාත්‍යාංශය වෙත ප්‍රසම්පාදන ගෙන්වාගෙන චක්‍රලේඛ ප්‍රකාරව දේපල හානි සඳහා වන්දි මුදල් ගෙවීම කඩිනම් කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා භාෂා පරිවර්තක තනතුරක් (සිංහල - ඉංග්‍රීසි) අනුමත වී නොතිබියදී භාෂා පරිවර්තක නිලධාරියකු සේවයේ යොදවාගෙන වැටුප් ගෙවීම් කර තිබුණි.	අමාත්‍යාංශය මඟින් නිලධාරියකු අනුයුක්ත කිරීම හේතුවෙන් එම තනතුරු කාර්ය මණ්ඩල වාර්තාව තුළ අතිරික්තයක් ලෙස පෙන්නුම් කරන බව.	කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදුකර තනතුරු අනුමත කර ගැනීම හෝ අතිරික්ත නිලධාරීන් සුදුසු ස්ථානයක් වෙත අනුයුක්ත කිරීමට පියවර ගත යුතුය.

(ආ)	2021 අගෝස්තු 06 දිනැති අංක 01/2021 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයේ සඳහන් ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2.2 ඡේදය ප්‍රකාරව එකම සේවා ස්ථානයක් තුළ වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා ස්ථාන මාරු වීම් ලබා දිය යුතු වුවද රත්තොට, අඹන්ගඟ කෝරළේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරීන් 66 දෙනෙකු එකම සේවා ස්ථානයේ වසර 05 ත් වසර 12 ත් අතර කාලයක් සේවය කරමින් සිටියද ඔවුන් වෙත ස්ථාන මාරුවීම් ලබාදී නොතිබුණි.	වාර්ෂික ස්ථාන මාරු හා වාර්ෂික නොවන ස්ථානමාරු අයදුම් කර ඇති බව හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැනි දුෂ්කර කොට්ඨාශ සඳහා ස්ථාන මාරු සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බව.	චක්‍රලේඛ අනුව ස්ථානමාරුවීම් ලබා දීමට කටයුතු කළ යුතුය.